# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 946/8 - 1996 ඔක්තෝබර් 23 වැනි බදාදා - 1996.10.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල් ඩී-බී. 21/78 IV.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1995 අංක 1 දරන පනතින් අවසන් වරට සංශෝධිත පරිදි වූ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මිය.,<br>
ලේකම්,<br>
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1996 ඔක්තෝබර් මස 21 වැනි දින,<br>
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය, 1996 අංක 13 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1979 දෙසැම්බර් මස 26 වන දින අංක 68/11 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1979 අංක 9 දරන කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) එහි 10 වන ඡේදයේ

(i) (1) වන අනුඡේදයේ (උ), (ඌ), (ඍ), (ඎ) සහ (ඏ) අකුරු අනුඡේද වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් අකුරු අනුඡේද ආදේශ කිරීමෙන් :-

- (උ) පරිසර විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;
- (ඌ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ;
- (ඍ) කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය භාර ජාතික ආයතනයේ විධායක ප්‍රධානයා ;
- (ඎ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ;
- (ඏ) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ;

(ii) ඒ ඡේදයේ (1) වන අනුඡේදයේ (ක) සහ (ග) අකුරු අනුඡේද පිළිවෙලින් (ග) සහ (ච) යනුවෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ